# ළ - ඉගෙනුම් පියස

# සුවෙන් පෙරට

කලාප අධ්‍යාපන කාර්යාලය

මිනුවන්ගොඩ

# 03.ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් වන ශ්‍රී ලංකාවට වර්ග කිලෝමීටර 65610 ක් පමණ විශාලවූ භූමි ප්‍රමාණයක් අයත් වේ. මෙම භූමි ප්‍රදේශය තුළ විවිධ භෞතික හා මානව ලක්ෂණ වලින් සමන්විත එකිනෙකට වෙනස් වූ කැපී පෙනෙන ප්‍රාදේශීය භූ දර්ශන 5ක් හඳුනාගත හැක.

1. කඳුකර භූ දර්ශනය
2. වියලි කලාපීය භූ දර්ශනය
3. තෙත් කලාපීය භූ දර්ශනය
4. යාපනය අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත භූ දර්ශනය
5. වෙරළ ආශ්‍රිත භූ දර්ශනය

## 01.කඳුකර භූ දර්ශනය

මුහුදු මට්ටමේ සිට මීටර් තුන්සියයකට වඩා උසින් යුක්ත බිම්වල කඳුකර භූ දර්ශනයක් දැකිය හැකියි. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ද සබරගමු කඳුකරයේ ද මෙවැනි භූ දර්ශන ඇත.

| භෞතික ලක්ෂණ | මානුෂ ලක්ෂණ |
|---|---|
| • කඳු වැටි<br>• සානු<br>• උස් කඳු මුදුන් වලින් ආරම්භව ගලා බසින ගංගා<br>• බෑවුම් ඔස්සේ ඇද හැලෙන දියඇලි<br>• උස්බිම් දෙකක් අතර පිහිටි කපොලු<br>• විෂමතාවට හා දේශගුණයට අනුකූල ව වැඩුණු වෘක්ෂලතා | • භූ විෂමතාවට අනුකූල ව ගොඩනැගුණු වංගු සහිත මාර්ග ජාලය හා කඳු බෑවුම් වල පිහිටි නිවාස<br>• තේ වතු |

**කඳුකර භූ දර්ශන කලාපයේ මානුෂ ආර්ථික ක්‍රියාකාරකම්**

1. තේ වතු ආශ්‍රිත රැකියාවල නිරත වීම
2. සංචාරක හොටෙල් හා ඒ ආශ්‍රිත රැකියාවල නිරත වීම
3. ව්‍යාපාරික එළවළු හා මල් වගාව
4. එළවළු පලතුරු මල් ආදිය පහතරට ප්‍රදේශවල සැපයීම
5. සංචාරකයින් සඳහා භාණ්ඩ අලෙවි කරන්නන්
6. සත්ව පාලන කටයුතුවල යෙදෙන්නන්

*පිටු අංක 34 හා 35ට අදාල ක්‍රියාකාරකම් කරන්න.

## 02.වියළි කලාපීය භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ වාරි ශිෂ්ටාචාරය ආරම්භ වූ ප්‍රදේශ ලෙස මෙම කලාපය හැඳින්විය හැකි අතර ප්‍රධාන වශයෙන් උතුරු, උතුරු මැද, නැගෙනහිර හා ගිනිකොන ප්‍රදේශවල වියළි කලාපීය භූ දර්ශන දැකිය හැක

| භෞතික ලක්ෂණ | මානුෂ ලක්ෂණ |
|---|---|
| 1.වසර පුරාම අධික උෂ්ණත්වයක් පවතී.<br>2. ලැබෙන වර්ෂාපතනය සීමිත වන අතර එය ලැබීම ද අවිනිශ්චිතයි.<br>3. පුළුල් තැනිතලාවක් පවතී එහි අතරින්පතර ශේෂ කඳු දක්නට ලැබේ.<br>4. ප්‍රදේශය හරහා ගලා බසින ගංගා වියළි ඍතුවේදී සිඳී යයි.<br>5. උස් කඳන් හා තද අරටු සහිත ගස් වලින් යුක්ත වනාන්තර ඇත.<br>6. යාල හා විල්පත්තු වැනි සත්ව අභය භූමි ද සෝමාවතිය හා මාදුරු ඔය වැනි වනෝද්‍යාන ද පිහිටා ඇත. | 1.කුඩා හෙල් වැටි අතරින් ගලා යන ගංගා හරස් කොට බඳින ලද වැව් දක්නට ලැබෙයි<br>2.වාරි ජලය ආශ්‍රිත වී වගාවද, ගොවිතැන ආශ්‍රිත සහල් හා සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත දක්නට ලැබෙයි.<br>3.මිනිසුන් විසින් ගොඩනගන ලද පන්සල්, පල්ලි, කෝවිල් හා මුස්ලිම් දේවස්ථාන ද දක්නට ලැබේ |

### ක්‍රියාකාරකම

පිටු අංක 37 ට අදාළ ක්‍රියාකාරකම කරන්න.

# 03.තෙත් කලාපීය භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ නිරිත හා බටහිර ප්‍රදේශ මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම්වල තෙත් කලාපීය භූ දර්ශනයක් දැකිය හැකියි. දිනපතා එහා මෙහා යන ජනතාව රථවාහන මෙන්ම සේවා කටයුතු මගින් නිර්මාණය වී ඇති සජීවී බව මෙම කලාපයේ විශේෂ ලක්ෂණයකි.

| භෞතික ලක්ෂණ | මානුෂ ලක්ෂණ |
|---|---|
| 1.තැනිතලා බිම්, රැළි බිම් හා වර්ෂය මුළුල්ලේ ගලා බස්නා ගංගා වගුරු බිම් සහිත භූ විෂමතාවක් දක්නට ලැබෙයි<br>2.වසර පුරා ම වාගේ පැතිර පවත්නා වර්ෂාපතනයක් සහිතයි<br>3.අධික වර්ෂාවත් සමග ගංගා පිටාර ගැලීමෙන් ගංගා නිම්න දිගේ නිර්මානය වී තිබෙන පිටාර තැනි, සාරවත් ගොඩබිම් බවට පත් වී තිබේ.<br>4.නිතර නිතර ගංගා පිටාර ගැලීමත් නායයෑම වැනි ක්‍රියාකාරීත්වයක් නිසා අවට භූ දර්ශනය වෙනස් වෙමින් පවතී | 1.වෙරළ ආශ්‍රිතව පොල්, ගංගා නිම්න ආශ්‍රිතව වී, කඳු බෑවුම් ආශිත රබර් හා තේ වගාව කෙරෙයි.<br>2.කටුනායක බියගම හා කොග්ගල වැනි වෙළඳ කලාප ගොඩනඟා ඇත<br>3.රත්මලාන ඒකල වැනි කර්මාන්ත පුර ගොඩනඟා ඇත<br>4.රෝහල්, පාසල්, පොලිසි වැනි සේවා මධ්‍යස්ථාන ද නළ ජලය, ජල විදුලිය වැනි යටිතල පහසුකම් වලින්ද පරිපූර්ණ වේ<br>5.සංවර්ධනය වූ මාර්ග පද්ධති, අධිවේගී මාර්ග, ගුවන් පාලම්, දුම්රිය මාර්ග සහිත දියුණු ප්‍රවාහන ජාලයක් පවතී.<br>6.නිවාස වල සිරස් ව්‍යාප්තිය දක්නට ලැබේ |

## ක්‍රියාකාරකම

1. තෙත් කලාපයේ සජීවි භූ දර්ශනයක් ඇති වීමට බලපා ඇති හේතු තුනක් ලියන්න
2. තෙත් කලාපීය භූ දර්ශනය චිත්‍රයකින් හෝ පින්තූර මගින් දක්වන්න
3. ලංකා සිතියමක පහත දැක්වෙන වැදගත් ස්ථාන නම් කරන්න

ගම්පහ, මීගමුව, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, මහනුවර, අනුරාධපුරය, සෝමාවතී වනෝද්‍යානය, නුවර වැව, පොලොන්නරුව, විල්පත්තු අභය භූමිය, කන්තලේ වැව, දිඹුලාගල, මන්නාරම් මඩු දේවස්ථානය, සීගිරිය, සේනානායක සමුද්‍රය, මිහින්තලේ

## 04. යාපනය අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත භූ දර්ශනය

ලංකාවේ උතුරින් යාපනය අර්ධද්වීපය හා ආශ්‍රිතව ඩෙල්ෆ්ට්, කයිට්ස්, නාගදීපය වැනි දූපත් කිහිපයක් පිහිටා ඇත

| යාපනය හා අවට දූපත් කලාපයේ භෞතික ලක්ෂණ | යාපනය හා අවට දූපත් කලාපයේ මානව ලක්ෂණ |
|---|---|
| • යාපනය අර්ධද්වීපය හා ඒ අවට දූපත් මෙම කලාපයට අයත් වේ.<br>• තැනිතලා බිම්,කලපු,දූපත්,වැලිතලා ආදියෙන් මෙම කලාපය සමන්විත වේ.<br>• රතු පස හා හුණු ගල් මෙහි බහුල යි<br>• ඉතා සීමිත වර්ෂාපතනයක් පවතී<br>• උෂ්ණත්වය මෙන්ම වාෂ්පීකරණය ද ඉතා අධිකයි<br>• කිමිදීම හා දිය නෑම පිණිස සුදුසු නොගැඹුරු මුහුද තීරයක් පවතියි | • කෘෂිකර්මාන්ත යටතේ අර්තාපල්, මිරිස්, රතුළූණු, හා බීට් වැනි එළවළු වර්ග ද මිදී, අඹ, හා කෙසෙල් වැනි පලතුරු වර්ග ද වගා කෙරේ.<br>• වෙරළ ආශ්‍රිත ව ධීවර කර්මාන්තය හා ලුනු නිපදවීම කරයි.<br>• නොයෙක් හස්ත කර්මාන්ත වල යෙදේ. තල්ගස මෙහි වැඩෙන ප්‍රධාන ශාකයයි. තල් ගසේ සියලු කොටස් ප්‍රයෝජනයට ගනියි.<br>• ජනග්‍රහණයෙන් වැඩි කොටසක් හින්දු භක්තිකයින් වේ. ඒ අනුව හින්දු කෝවිල් ආගමික උත්සව හා පෙරහැර වැනි සංස්කෘතිකාංග වලට මුල් තැන දෙයි.<br>• දූපත් ආශ්‍රිත මුහුදු තීරයේ සංචාරකයින්ගේ ආකර්ශනයට ලක් වී ඇත. එම නිසා සංචාරක කර්මාන්තය ද කෙරේ |

### ක්‍රියාකාරකම 01

01.තල් ගස යාපන අර්ධද්වීපය ජනතාවට ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න.

## 05. වෙරළ ආශ්‍රිත භූ දර්ශනය

ශ්‍රී ලංකාව වටා ඇති දූපත් බොකු කලපු තුඩු වගුරු වැනි භූ ලක්ෂණ වලින් සමන්විත වෙරළ තීරය ඊට ම සුවිශේෂී වූ දර්ශනයකින් ද යුක්ත වේ.

## ක්‍රියාකාරකම 02

01.වෙරළ ආශ්‍රිත භූ දර්ශනයට අදාළ භෞතික හා මානව ලක්ෂණ වගුවක සටහන් කරන්න

02..ශ්‍රී ලංකාවේ මොකුත් කලපු තුඩු හා දූපත් දෙක බැගින් නම් කරන්න

## ක්‍රියාකාරකම 03

01.ඔබ ජීවත් වන ප්‍රදේශයෙහි භූ දර්ශනය අධ්‍යයනය කොට එහි දක්නට ඇති භෞතික හා මානව ක්‍රියාකාරකම් විස්තර කරන්න.